පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.25 පැය 0540 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1939 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. තීරුබදු නොගෙවා නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මෙරටට ගෙන එන ලද ජීප් රථයක් අත්අඩංගුවට - මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය.**

මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත සිදු කරන ලද විමර්ශනයකින් අනතුරුව 2025.10.24 වන දින තීරුබදු රහිතව නීත්‍යානුකූල නොවන ආකාරයෙන් මෙරටට රැගෙනවිත් ව්‍යාජ ලෙස ලේඛණ සකස් කල ජීප් රථයක් මිරිහාන ප්‍රදේශයේදී වර්ථමාන හිමිකරුගේ නිවසේ තිබියදී අත්අඩංගුවට ගෙන ඇත.

සිදුකරන ලද වැඩිදුර විමර්ශනයේදී නීතිවිරෝධී ලෙස ගෙන්වන ලද ජීප් රථය හා එම රථයේ දත්ත මෝටර් රථවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද වෙනත් ජීප් රථයක දත්ත වලට ව්‍යාජව ඇතුලත් කර ලියාපදංචි කර ඇති බව අනාවරණය වී ඇත.

සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. ටී 56 ජීව පතරොම් 08 ක් සහ එම පුහුණු පතරොම් 15 සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.10.24 වන දින සවස් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ අඹගහවත්ත ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමකට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **ටී 56 ජීව පතරොම් 08 ක් හා පුහුණු පතරොම් 15 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන මිනුවන්ගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 53 ක් වන අඹගහවත්ත, මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දිය අනතුරකින් විදෙස් ජාතික කාන්තාවක් බේරා ගැනීම - පොලිස් ජීවිතාරක්ෂක ඒකකය මිරිස්ස.

2025.10.24 වන දින සවස් කාලයේදී කොටවිල පොලිස් වසමේ මිරිස්ස වෙරළ තීරයේ දියනෑමට ගිය විදෙස් ජාතික කාන්තාවක් දිය වැලකට හසුව මුහුදට ගසාගෙන යමින් සිටියදී වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත උප පොලිස් පරීක්ෂක මෙන්ඩිස්, පොලිස් සැරයන් 59416 අජන්ත, පොලිස් සැරයන් 40674 ප්‍රියදර්ශන, පොලිස් කොස්තාපල් 96986 දිසානායක, පොලිස් කොස්තාපල් 104360 දේශාන් හා පොලිස් කොස්තාපල් 105268 කහවත්ත යන නිලධාරින් විසින් එම කාන්තාව බේරාගෙන මූලික ප්‍රථමාධාර ලබා දී ඇත.

**මෙලෙස අනතුරට පත්ව ඇත්තේ අවුරුදු 30 ක් වන රුමේනියා ජාතික කාන්තාවකි.**

## 04. සැකකටයුතු මරණයක් - මිනුවන්ගොඩ පොලිස් වසම.

2025.10.24 වන දින දහවල් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ යටියන ප්‍රදේශයේ නිවසක් තුල කාන්තාවක් සැකකටයුතු ලෙස මියගොස් සිටින බවට මිනුවන්ගොඩ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 71 ක් වූ යටියන, මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම සැකකටයුතු මරණය සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශනයේදී මෘත දේහය පුරා මිරිස් කුඩු තැවරී ඇති බවට නිරික්ෂණය වී ඇති අතර මෙම මරණය සිදුවූ ආකාරය සම්බන්ධ තොරතුරු මෙතෙක් අනාවරණය වී නොමැත.

මෘත ශරීරය පශ්චාත් මරණ පරික්ෂණය සඳහා ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - දොඩන්ගොඩ පොලිස් වසම.

2025.10.24 වන දින සවස් කාලයේ දොඩන්ගොඩ පොලිස් වසමේ මළබඩ පුහාබුගොඩ මාර්ගයේ මළබඩ ප්‍රදේශයේදී මළබඩ හන්දිය දෙස සිට පුහාබුගොඩ දෙසට ධාවනය වූ ටැක්ටර් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු හා පිටුපස ගමන් කල දෙදෙනෙකු තුවාල ලබා නාගොඩ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු යතුරුපැදියේ පිටුපස ගමන් කල පුද්ගලයෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ යටදොල, නාවුත්තුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දොඩන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**